(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(5).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 අගෝස්තු 21 සිකුරාදා**

---

**2026 සැප්තැම්බර් 08 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 202 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මැයි 19 දිනැති අංක 2489/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.08.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජූනි 17 දිනැති අංක 2493/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.08.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය,— 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික, එකී පනතේ 13 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අතර, ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු හෙයින් ද;

කොමිෂන් සභාව සඳහා පත් කරනු ලබන සාමාජිකයින් අතරින් සභාපතිවරයා ද ඇතුළුව අවම වශයෙන් තිදෙනෙකු (03) පූර්ණ කාලීන සාමාජිකයින් වශයෙන් පත් කිරීමට අදාළ පනතේ 5(5) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පැවරෙන කාර්යභාරයේ වැදගත්කම ද සැලකිල්ලට ගනිමින්, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා ගෙවීම සඳහා 2026.08.10 දිනැති අංක 26/1522/819/010-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇති හෙයින් ද:—

(i) සභාපතිවරයා වෙත මාසිකව රු.135,000.00ක ද, සාමාජිකයින් වෙත මාසිකව රු.90,000.00ක ද පාරිශ්‍රමික ගෙවීමට;

(ii) සභාපතිවරයා සඳහා මාසිකව රු.6,000.00ක ද, සාමාජිකයින් වෙත රු.4,250.00ක ද සන්නිවේදන දීමනාවක් ගෙවීමට; සහ

(iii) මාසික ඉන්ධන හා ප්‍රවාහන දීමනාව පහත පරිදි ගෙවීමට:

| | ඉන්ධන දීමනාව | ප්‍රවාහන දීමනාව* |
|---|---|---|
| සභාපති | 220L | රු.50,000.00 |
| අනෙකුත් සාමාජිකයින් | - | රු.25,000.00 |

* සභාපතිට ප්‍රවාහන දීමනාව හිමි වන්නේ රජය විසින් රියදුරෙකු සහිත නිල වාහනයක් ලබාදිය නොහැකි අවස්ථාවන්හිදී පමණි.

ඊට අනුකූලව, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාරව, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට ඉහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ගෙවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 සැප්තැම්බර් 08 අඟහරුවාදා)**

2256/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.04.05 දින ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ඩිජිටල් පරිවර්තනය පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එම ගිවිසුමේ පාර්ශ්වකරුවන් කවුරුන්ද;

(iii) ගිවිසුම ප්‍රකාරව ගිවිසුමේ එක් එක් පාර්ශ්වය සතු වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට එම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රගතිය කවරේද;

(v) ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් මේ දක්වා ආයෝජනය කර ඇති මුදල කොපමණද;

(vi) එම ගිවිසුම අනුව කටයුතු කිරීම ප්‍රමාදවී තිබේද;

(vii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 සැප්තැම්බර් 09 බදාදා)**

2257/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.04.05 දින ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අධි වෝල්ටීයතා සරල ධාරා සම්ප්‍රේෂණය ඔස්සේ විදුලිය ආනයනය සහ අපනයනය කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එම ගිවිසුමේ පාර්ශ්වකරුවන් කවුරුන්ද;

(iii) ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ වනවිට අත්කරගෙන ඇති ප්‍රගතිය කවරේද;

(iv) ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය හෝ රජයට අනුබද්ධ ආයතන විසින් මේ දක්වා දරා ඇති වියදම කොපමණද;

(v) මෙම ගිවිසුම අනුව කටයුතු කිරීම මඟින් ශ්‍රී ලංකාවට ලබාගත හැකි ප්‍රතිලාභ කවරේද;

(vi) ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී පවතින බාධා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා)**

2258/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර 2025.04.05 දින අත්සන් කරන ලද ආරක්ෂක සහයෝගිතා අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ඇති කර ගන්නා ලද එකඟතා කවරේද;

(ii) එම එකඟතා අතරින් මේ වනවිට ක්‍රියාත්මක කර අවසන් කර ඇති කටයුතු කවරේද;

(iii) ගිවිසුම පරිදි ඇති කරගන්නා ලද එකඟතාවයන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවී තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රමාදයට හේතු කවරේද;

(v) එම ගිවිසුම ප්‍රකාරව ඉන්දියාව සමඟ ඇති කරගෙන ඇති එකඟතාවයන් අනුව ක්‍රියා කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 සැප්තැම්බර් 11 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 132/2026

ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා,— 1983 'කළු ජූලිය' සමඟ ඇති වූ ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සත්‍යය සෙවීම, විනාශයන් තක්සේරු කිරීම සහ නැවත එවැනි ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම වැළැක්වීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කිරීම,— 1983 'කළු ජූලිය' සහ වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ සමූල ඝාතන, ජනවාර්ගික ගැටුම් සහ ප්‍රචණ්ඩ ක්‍රියාවන්, රටේ ජාතික ඒකාබද්ධතාව, සමාජ ව්‍යුහය සහ ආර්ථිකය මත දරුණු කැළලක් ඇති කර ඇති හෙයින් ද, මෙම ගැටුම් සහ ප්‍රචණ්ඩ ක්‍රියාවලදී දහස් සංඛ්‍යාත ජනතාවක් ඝාතනයට ලක්ව, දස දහස් සංඛ්‍යාත පිරිසක් අවතැන් වී සරණාගතයන් බවට පත් කළ හෙයින් ද, නිවාස සහ ව්‍යාපාරික ස්ථාන ඇතුළු වටිනා දේපළ ගිනි තබා සම්පූර්ණයෙන්ම විනාශ කරන ලද හෙයින් ද, මෙම සිදුවීම සිදුවී වසර හතළිහකට වඩා වැඩි කාලයක් ගතවී ඇතත්, මෙම ගැටුම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා මෙහෙය වූ තැනැත්තන් හඳුනාගෙන නොමැති හෙයින් ද, සිදු වූ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ දේපළ හානි පිළිබඳව පුළුල් හා ස්වාධීන විමර්ශනයක් මෙතෙක් පවත්වා නොමැති හෙයින් ද, මෙවැනි ජනවාර්ගික ගැටුම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා නැවත අප රට තුළ සිදු නොවීම තහවුරු කිරීම සහ රටේ සියලුම ජන කොටස් අතර තිරසර සමගිය හා සංහිඳියාව ගොඩනැඟීම අත්‍යවශ්‍ය වන හෙයින් ද, එකී ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සත්‍යය සෙවීම, විනාශයන් තක්සේරු කිරීම සහ නැවත එවැනි ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම වැළැක්වීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 සැප්තැම්බර් 11 සිකුරාදා)**

2259/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2020.01.01 දින සිට 2026.03.31 දින දක්වා කාල සීමාව තුළ —

(i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් නීතිඥ ගාස්තු ලෙස ගෙවා ඇති මුදල කොපමණද;

(ii) එම ආයතනය පාර්ශ්වකරුවෙකුවූ නඩුවල අංක, අදාළ අධිකරණ සහ එක් එක් නඩුව සඳහා නීතිඥ ගාස්තු වශයෙන් ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නඩු කටයුතුවලට අදාළ නොවන නීතිමය උපදෙස් ලබා ගැනීම සඳහා නීතිඥවරුන් වෙත ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iv) නඩු සහ අනෙකුත් නීතිමය උපදෙස් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සේවය ලබා ගෙන ඇති නීතිඥවරුන් කවුරුන්ද;

(v) එම එක් එක් නීතිඥවරයා වෙත ගෙවා ඇති නීතිඥ ගාස්තු වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අදාළ නීතිමය කටයුතු සඳහා අනාගතයේදී වැයවන මුදල් අවම කර ගැනීම පිණිස වර්තමාන පරිපාලනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 සැප්තැම්බර් 22 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

325/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රෝහල්වල දෛනික මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තීරණාත්මක අයිතම 15ක් සහ අත්‍යවශ්‍ය ලෙස හඳුනාගත් අයිතම 354ක් සම්බන්ධයෙන් වර්තමාන තොග තත්ත්වය;

(ii) එම අයිතම අතරින් සම්පූර්ණයෙන් තොග අවසන්වී ඇති අයිතම සහ මාස 02කට පමණක් ප්‍රමාණවත් තොග පවතින අයිතම වෙන් වෙන් වශයෙන්;

(iii) සැපයුම්කරුවන්ට ගෙවිය යුතු දින 60, 90, 120 සහ 150 ඉක්මවා ඇති හිඟ ගෙවීම්;

(iv) දින 60 ඉක්මවා ඇති හිඟ ගෙවීම් එලෙස ප්‍රමාද වීමට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුලිය, ජලය, ආහාර සහ රෙදි සේදීම සඳහා ගෙවීම්වල වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දේශීය නිෂ්පාදන සැපයුම්කරුවන්ට හිඟව පවතින, දින 60 ඉක්මවා ප්‍රමාදවී ඇති ගෙවීම් නිරවුල් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

474/2025

ගරු රවී කරුණානායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පිරවුම්හල්වල නම් සහ ලිපින කවරේද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සහ අනෙකුත් සමාගම් යටතේ ක්‍රියාත්මක වන ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එක් එක් දිස්ත්‍රික්කය තුළ නිකුත් කරන ලද ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම බලපත්‍ර නිකුත් කර ඇති පුද්ගලයින්ගේ නම් සහ ලිපින කවරේද;

(vi) එම බලපත්‍ර නිකුත් කිරීම තුළින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපයන ලද ආදායම කොපමණද;

(vii) ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(viii) ඉන්ධන පිරවුම්හල් සඳහා කොමිස් මුදල් ගෙවනු ලබන නෛතික පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

786/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ජා-ඇල ඩිපෝව සතුව ඇති බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝව මඟින් දෛනිකව ධාවනය කරනු ලබන බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) ඩිපෝවේ මේ වනවිට පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) ජා-ඇල නගරයේ සිට දුරගමන් සේවා ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

885/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත්කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

908/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා පදනම ආයතනය පිහිටුවීමේ අරමුණු කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනයට රජය මඟින් ලබා දුන් ප්‍රතිපාදන එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට මෙම ආයතනය, එහි ආරම්භක අරමුණුවලින් බැහැරවී, මුදල් උපයන ආයතනයක් බවට පත්වී තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

945/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් 'බැහැර නොකරන ලෙස' දන්වමින් ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකු විසින් කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කරන ලද දිනය කවරේද;

(ii) එම ලිපිය ලැබීමෙන් පසුවද ඉඩම් බැහැර කර ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම බැහැර කොට ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එලෙස ඉඩම් බැහැර කිරීමට හේතුව කවරේද;

(v) එම ඉඩම් ලබාදී ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(vi) කොමිෂන් සභාව සතු ඉඩම් නිසි නියාමනයකට ලක්කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1039/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් සඳහා ලබා දීම පිණිස සුහුරු පුවරු (Smart boards) මෙරටට ආනයනය කරන ලද වර්ෂය කවරේද;

(ii) එසේ ආනයනය කරන ලද සුහුරු පුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට පාසල් සඳහා ලබාදී ඇති එම සුහුරු පුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම සුහුරු පුවරු කඩිනමින් බෙදා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1379/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට දිවයින පුරා පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු-නැගෙනහිර පළාත්වල තොරතුරු තාක්ෂණ, ගෘහ ආර්ථික විද්‍යාව සහ සෞන්දර්ය විෂයයන් සඳහා පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට ඩිප්ලෝමාධාරින් ගුරු සේවයට බඳවා ගැනීමට තීරණය කර තිබේද;

(iv) එසේ නම්, මේ වනවිට ගුරු සේවයට බඳවා ගෙන ඇති ඩිප්ලෝමාධාරින් සංඛ්‍යාව විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ගුරු සේවයට බඳවාගැනීමේදී රජය විසින් පිළිගනු ලබන ඩිප්ලෝමාවන් ප්‍රදානය කරන ආයතන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1916/2026

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ආයුර්වේද දෙපාර්තමේන්තුව සතුව පවතින ඔසු උයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඔසු උයන් පිහිටි ස්ථාන කවරේද;

(iii) ඉහත එක් එක් ඔසු උයනට අයත් භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ඔසු උයන්වල සේවයේ නියුතුව සිටින සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ඔසු උයන්වලින් ලැබෙන වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඔසු උයන් වෙනුවෙන් වර්ෂයකට වැය වන සාමාන්‍ය වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1927/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල-මාදම්පේ මාර්ගය, සබරගමුව සහ දකුණු පළාත යා කරන ප්‍රධාන මාවතක් මෙන්ම සංචාරක ආකර්ෂණය සහිත මාර්ගයක් බව පිළිගන්නේද;

(ii) එම මාර්ගයේ මාදම්පේ සිට සූරියකන්ද දක්වා වන මාර්ග කොටස සංවර්ධනය කර ඇති නමුත්, දෙනියාය 51 හන්දිය දක්වාවූ කොටසෙහි සංවර්ධන කටයුතු අවසන් කර නොමැති බැවින් ජනතාව පීඩාවට පත්ව ඇති බව දන්නේද;

(iii) එම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය අත්හිටුවීමට හේතුවූ කරුණු කවරේද;

(iv) එම ව්‍යාපෘතිය යළි ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(v) ගාල්ල-මාදම්පේ මාර්ගය, ඓතිහාසික වටිනාකම් ආරක්ෂා වන පරිදි 'සංචාරක මාර්ගයක්' ලෙස සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 සැප්තැම්බර් 23 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1066/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතේ පොල් වගාවට බලපාන සුදු මැස්සන් පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) බලපෑමට ලක්වූ පොල් වගාකරුවන් සඳහා වන්දි/මූල්‍ය ආධාර ලබා දීමට සැලසුම් කර තිබේද;

(iii) සුදු මැස්සාගේ පැතිරීමට හේතු වන දේශගුණික තත්ත්වයන් සම්බන්ධයෙන් පාරිසරික ඇගයීම් සිදු කර තිබේද;

(iv) ජෛව පාලකයක් ලෙස එන්කාර්සියා ග්වාඩලූප් (*Encarsia guadeloupe)* නැමැති කෘමියා ලැබී ඇති කලාප සංඛ්‍යාව කොපමණද;

(v) එම මැදිහත්වීමෙහි ඵලදායිතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සුදු මැස්සා අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් තිබේද;

(ii) ජීව විද්‍යාත්මක පාලන ක්‍රම සහ විකල්ප පිළියම් පිළිබඳ ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබේද;

(iii) පොල් වගාවේ පළිබෝධ පාලනය සඳහා අවශ්‍ය කරන හදිසි අරමුදල් මීළඟ අයවැයෙන් වෙන් කරන්නේද;

(iv) නව පළිබෝධ පාලන ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබේද;

(v) කෘෂිකාර්මික ව්‍යසනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා සහ එයට විසඳුම් සෙවීම සඳහා අන්තර්-අමාත්‍යාංශ සම්බන්ධීකරණයක් ඇති කිරීමට රජය ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1193/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, වේලනෛ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වළුක්කියාරු, අරාලි, වේලනෛ සහ පුංගුඩුතිව් හරහා කුරිකට්ටුවාන් දක්වා ඇති මාර්ගය එම ප්‍රදේශයේ ප්‍රධාන ප්‍රවාහන මාර්ගය බව දන්නේද;

(ii) එසේ නම්, එම මාර්ගයේ මුළු දිග කොපමණද;

(iii) එම මාර්ගය අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද දිනය කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද්දේ කවුරුන්ද;

(vi) එම මාර්ගය දිගු කලක් ප්‍රතිසංස්කරණය නොකිරීමට බලපා ඇති හේතු කවරේද;

(vii) ප්‍රතිසංස්කරණ කටයුතු පමා වීම හේතුවෙන් එහි ජනතාව මුහුණ පා සිටින දුෂ්කරතා කවරේද;

(viii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1268/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාවලඩිවට්ටෙට ප්‍රදේශයේ 1986,1989,1991 සහ 1997 වර්ෂවල එම දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් ඉඩම් කච්චේරියක් පවත්වා, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය මත අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ගොවීන් 21කට බලපත්‍ර ලබාදී ඇති බව දන්නේද;

(ii) පසුගිය වර්ෂ 30 මුළුල්ලේ කෘෂිකාර්මික හා ගොඩ ඉඩම් වගා කටයුතුවල නිරතවූ ගොවීන් 21 දෙනෙකුට, අම්පාර දිසාපතිවරයාගේ නියෝග අනුව ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එම ඉඩම්වල කෘෂිකාර්මික කටයුතු නොකරන ලෙස දන්වා වරින් වර බාධා කර ඇති බව දන්නේද;

(iii) එම ගොවීන්ට අයත් ඉඩම් හඳුනාගෙන නැවත භාරදීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා සහ ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කණ්ඩායමක් අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් පත්කර එම ප්‍රදේශයට යවා ඇති අතර, එම ඉඩම් භාරදීම වැළැක්වීම සඳහා පිරිසක් බාධා කර ඇති බව දන්නේද;

(iv) එම ඉඩම් අදාළ ගොවීන්ට නැවත ලබා දීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1529/2025

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ පාසල් සඳහා අනුමත, මේ වනවිට සේවයේ නියුතු, අතිරික්ත සහ පුරප්පාඩුව පවතින අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කලාපය අනුව;

(ii) අනුමත කාර්ය මණ්ඩල වෙන්කිරීම් අනුව රාත්‍රී මුරකරුවන් නොමැති පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 05 තුළ දිවයිනේ පාසල්වලින් වාර්තාවී ඇති ඉලෙක්ට්‍රොනික උපකරණ සොරකම් සිද්ධීන් පිළිබඳ තොරතුරු තිබේද;

(ii) පාසල්වල ඇති තොරතුරු තාක්ෂණ උපකරණවල ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම උපකරණවල ආරක්ෂාව සඳහා රාත්‍රී මුරකරුවන් යෙදවීම හෝ විකල්ප ආරක්ෂිත ක්‍රියාමාර්ග සඳහා 2026 අයවැයෙන් විශේෂ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) 2027 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත ඩිජිටල් අධ්‍යාපන වැඩසටහන් ප්‍රමාණවත් ආරක්ෂාවක් සහ අඛණ්ඩ නඩත්තු කටයුතු සමඟ ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1661/2025

ගරු චානක මාදුගොඩ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මාසික සහල් අවශ්‍යතාවය සහල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මාසික සහල් අවශ්‍යතාවය පරිභෝජන අංශ අනුව බෙදී යන ආකාරය සහ එක් එක් අංශය සඳහා අවශ්‍ය සහල් වර්ගය හා ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙරට නිෂ්පාදනය කෙරෙන සහල් වර්ග කවරේද;

(iv) එම එක් එක් සහල් වර්ගය වාර්ෂිකව නිෂ්පාදනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2025 වර්ෂයේ යල කන්නය තුළ වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වී වර්ග, ප්‍රමාණ සහ ඒ සඳහා වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම මණ්ඩලය සතු වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව, ඒවා පිහිටි ප්‍රදේශ සහ එම එක් එක් මධ්‍යස්ථානය මඟින් 2025 යල කන්නය තුළ මිලදී ගෙන ඇති වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මණ්ඩලයට අයත් සක්‍රිය හා අක්‍රිය වී ගබඩා සංඛ්‍යාව සහ ඒවා පිහිටි ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1682/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කින්නියා, කුරින්ජක්කේනි පාලම ඉදිකර අවසන් වන තෙක් තාවකාලිකව පාලම් පාරු සේවාවක් යොදවා ඇති බව දන්නේද;

(ii) එම පාලම් පාරුව මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) පාලමේ ඉදිකිරීම් කටයුතු අවසන්වූ පසු, සේවයේ යොදවා ඇති එම පාලම් පාරුව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වන්නේද, නැතහොත් කොන්ත්‍රාත් සමාගමට අයත් වන්නේද;

(iv) එම පාලම් පාරුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අනාරක්ෂිත මුහුදු ප්‍රවාහන කටයුතු සිදුවන ප්‍රදේශවල ප්‍රවාහන කටයුතු සඳහා යෙදවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1758/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2020.01.01 දින සිට 2025.01.01 දින දක්වා පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' වැඩසටහන යටතේ ඔප්පු ලබාගැනීම සඳහා ඉල්ලුම් කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) එම වැඩසටහන යටතේ ඉහත සඳහන් කාලය තුළ ඉල්ලුම් කරන ලද පුද්ගලයින්ට 'උරුමය' ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' ඔප්පු සඳහා ඉල්ලුම් කළ බොහෝ පුද්ගලයින්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) එම පුද්ගලයින්ට මේ දක්වා එම ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1912/2026

ගරු බී. ආරියවංශ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කෙසෙල් වගා කරන ප්‍රදේශ කවරේද;

(ii) කෙසෙල් වගාවේ නිරත ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) කාලගුණික බලපෑම් සහ වන සතුන්ගෙන් සිදුවන හානි හේතුවෙන් කෙසෙල් ගොවීන් දැඩි දුෂ්කරතාවලට මුහුණපාන බව දන්නේද;

(iv) එම හානි සඳහා ගොවීන්ට වන්දි හෝ රක්ෂණ ආවරණයක් ලබාදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1942/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පවතින ස්වාභාවික සම්පත් උපයෝගී කරගනිමින් රටට අවශ්‍ය විදුලි බලය නිෂ්පාදනය කිරීම සඳහා දිගු කාලීන සැලසුමක් රජය සතුව තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම යටතේ එක් එක් ස්වාභාවික සම්පත මඟින් ලබා ගැනීමට අපේක්ෂිත මුළු විදුලි බල ප්‍රමාණයේ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදුලි බල නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමට ගතවන අපේක්ෂිත කාලය කොපමණද;

(iv) සූර්ය බලශක්ති නිෂ්පාදන සැලසුම යටතේ වහල මත සූර්ය පැනල සවි කිරීම සහ භූමිය මත සූර්ය පැනල සවි කිරීම සඳහා අපේක්ෂිත කාලරාමුව කවරේද;

(v) භූමිය මත සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘති සඳහා සාරවත් සහ නිසරු ඉඩම් භාවිතා කිරීම හේතුවෙන් ස්වාභාවික පරිසර පද්ධතියට බලපෑමක් සිදුවන්නේද;

(vi) වහල මත සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඒවා දිරිගැන්වීමට බාධා තිබේද;

(vii) එසේ නම්, එම බාධා කවරේද;

(viii) සහන පදනම යටතේ ක්‍රියාත්මක වන සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා මේ වනවිට පහසුකම් සැපයීම සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2271/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුද්දර ගාස්තු ගණනය කිරීම සම්බන්ධයෙන් පළාත් සභා මට්ටමේ වගකීම දරන ආයතන කවරේද;

(ii) එම ගාස්තු ගණනය කිරීමේදී එක් එක් දේපළ වෙන වෙනම තක්සේරු කරනු ලබන්නේද;

(iii) මෙම ගාස්තු ගණනය කිරීම සඳහා දේපළ තක්සේරු කිරීමේදී ඉඩම්වල පිහිටි ගොඩනැගිලි ද සැලකිල්ලට ගනු ලබන්නේද;

(iv) මුද්දර ගාස්තු සඳහා දේපළ තක්සේරු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් සුදුසුකම්ලත් නිලධාරින් පළාත් සභා මට්ටමේ ආයතනවල සේවයේ නියුතුව සිටින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඉඩම් හා දේපළ තක්සේරුව සඳහා බලයලත් පුද්ගලයන් සහ ආයතන කවරේද;

(ii) දේපළ තක්සේරුව නිසි පරිදි සිදුවන බවටත් ඒ අනුව අයවිය යුතු මුද්දර ගාස්තු පළාත් සභාවලට ලැබෙන බවටත් තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 සැප්තැම්බර් 24 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2097/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන 'අග්‍රගන්‍ය ගුරු වෘත්තීය සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන' කවරේද;

(ii) මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෙවෙල්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වෙල්ලස්ස ජාතික පාසල ආසන්නයේ ඇති මධ්‍යස්ථානය මේ වනවිට භාවිතයට ගනු ලබන්නේද;

(iii) එසේ නම්, එය කුමන කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන්නේද;

(iv) එම මධ්‍යස්ථානය පාලනය කරන අමාත්‍යාංශය/ආයතන කවරේද;

(v) මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා දරා ඇති මුළු පිරිවැය කොපමණද;

(vi) එම මධ්‍යස්ථානය මඟින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කවරේද;

(vii) පසුගිය වර්ෂ 02 තුළ එම මධ්‍යස්ථාන මඟින් පුහුණුව ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(viii) එම ආයතනයෙන් ලබාදෙන සේවාවන් ඵලදායි මට්ටමින් පවතින්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2123/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ 'මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රීති' සහ 'පාරිභෝගික ප්‍රඥප්ති අතිරේකය' මඟින් ආබාධ සහිත පුද්ගලයන්ගේ මූල්‍ය අන්තර්කරණය තහවුරු කර ඇති බව පිළිගන්නේද;

(ii) ඇතැම් බැංකු විසින් දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට කේවල ගිණුම් විවෘත කිරීම, ණය පහසුකම් ලබා ගැනීම සහ ඇපකරුවන් ලෙස කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන බව පිළිගන්නේද;

(iii) ඉහත (i)හි සඳහන් එම නියෝග සියලුම බැංකු තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) නියෝගවලට පටහැනි වන පරිදි පවත්වාගෙන යනු ලබන බැංකුවල අභ්‍යන්තර ණය ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රෝද පුටු භාවිත කරන්නන් සහ මිහිමිත් ප්‍රජාව සඳහා සියලුම බැංකු ශාඛාවල ප්‍රමිතිගත බෑවුම් මාර්ග සහ පහත් මට්ටමේ සේවා කවුන්ටර පැවතිය යුතු වුවද, බහුතර බැංකු ශාඛාවල එම පහසුකම් නොමැති බව පිළිගන්නේද;

(ii) එම පහසුකම් සියලුම බැංකු ශාඛාවල සලසා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2190/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාත තුළ ලියාපදිංචි කර ඇති ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන අතරින් රජයේ සහ ස්වේච්ඡා මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම මධ්‍යස්ථාන තුළ වයස අවුරුදු 18 සම්පූර්ණ කර ඇති ළමයින් සංඛ්‍යාව කොපමණද;

(iv) වයස සම්පූර්ණ කළ ළමයින් සමාජගත කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(vi) එසේ සමාජගත කරනු ලබන එම ළමයින් සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන්නේද;

(vii) එසේ නම්, එම ක්‍රියාවලිය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ක්‍රියාත්මක වන සමාජගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානවලින් පිටව යන පිරිමි ළමුන් අපචාර ක්‍රියාවලට හෝ නීතිවිරෝධී ක්‍රියාකාරකම්වලට යොමුවීම සම්බන්ධයෙන් වාර්තාවී තිබේද;

(ii) ළමා සංවර්ධන මධ්‍යස්ථානවලින් පිටව යන ගැහැණු ළමුන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරම් ක්‍රියාවලියක් නොමැතිවීම හේතුවෙන් ඔවුන්ගේ දරුවන්ද පසුව ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට යොමු වන තත්ත්වයක් තිබේද;

(iii) එවැනි තත්ත්වයන් වැළැක්වීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2196/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවක වැටුප් සහ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් දීර්ඝ කාලයක සිට විෂමතා පවතින බව දන්නේද;

(ii) එම ගැටලු විසඳීම සඳහා වර්තමාන රජය විසින් රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාව පත් කළ දිනය සහ එහි විෂය පථය කවරේද;

(iii) කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ නම් සහ ලිපින කවරේද;

(iv) කොමිෂන් සභාවේ කටයුතු සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(v) එම කොමිෂන් සභාව විසින් ලබාදී ඇති නිර්දේශ කවරේද;

(vi) එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2206/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුවලට මුහුණ පා සිටින ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) මෙම ගම්මානවල පානීය ජල ගැටලු විසඳීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2237/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුවේ සිට පොතුවිල් දක්වාවූ මුහුදු තීරයට අයත් ගැඹුරු මුහුදේ ධීවරයන්ගේ මත්ස්‍ය අස්වැන්න මුහුදු කොල්ලකරුවන් විසින් පැහැර ගන්නා බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් ධීවරයන්ගේ ජීවනෝපාය දැඩි ලෙස පසුබෑමට ලක්ව ඇති අතර, එමඟින් ඔවුන්ගේ පවුල්වල ආර්ථික තත්ත්වයද අයහපත් ලෙස බලපෑමට ලක්ව ඇති බව දන්නේද;

(iii) මෙම තත්ත්වය තවදුරටත් පැවතියහොත්, බොහෝ ධීවරයන් පාරම්පරික ධීවර කර්මාන්තයෙන් ඉවත්වීමේ අවදානමක් පවතින බව පිළිගන්නේද;

(iv) මුහුදු මංකොල්ලකෑම් සඳහා යොදාගනු ලබන අධිවේගී යාන්ත්‍රික යාත්‍රා හඳුනාගැනීම හා නිරීක්ෂණය කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

(v) මේ දක්වා හඳුනාගෙන ඇති මුහුදු කොල්ලකරුවන්ට සහ ඔවුන්ට සහාය ලබාදෙන පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති නීතිමය පියවර කවරේද;

(vi) මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව සහ අනෙකුත් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අමාත්‍යාංශය විසින් මේ වනතෙක් ගෙන ඇති පියවර කවරේද;

(vii) එම ප්‍රදේශයේ ගැඹුරු මුහුදේ ධීවර කටයුතුවල නිරත ධීවරයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගෙන ඇති ස්ථිර විසඳුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2248/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.01.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික බඩ ඉරිඟු නිෂ්පාදනය කොපමණද;

(ii) එම කාලය තුළ බඩ ඉරිඟු ආනයනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) බඩ ඉරිඟු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2274/2026

ගරු කංචන වැලිපිටිය මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශය මඟින් අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) ඒ සඳහා වැයකර ඇති මුළු මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීම මඟින් අපේක්ෂා කළ ප්‍රතිලාභ කවරේද;

(iv) මේ වනවිට ලබාගෙන ඇති ප්‍රතිලාභ සහ එම ප්‍රතිලාභ ලබා ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2279/2026

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩපුස්සැල්ලාව ප්‍රදේශයේ ප්‍රධාන රෝහලක් වන ඩෙල්මාර් ප්‍රාදේශීය රෝහලේ අඩුපාඩු පවතින බවත්;

(ii) යම් හදිසි අනතුරකදී ප්‍රතිකාර ලබා දීම සඳහා හෝ වෙනත් විශේෂ සේවාවන් සැපයීම සඳහා එම රෝහලේ ප්‍රමාණවත් ප්‍රථමාධාර පහසුකම් නොමැති බැවින් එවැනි අවස්ථාවලදී රෝගීන් නුවරඑළිය හෝ මහනුවර රෝහල් වෙත යොමු කරන බවත්;

(iii) එම රෝහල සඳහා ගිලන් රථ පහසුකමක් නොමැති බවත්;

(iv) එම තත්ත්වය හේතුවෙන් රෝගීන්ට පෞද්ගලික වියදමින් වාහන කුලියට ගෙන රෝහල් වෙත යාමට සිදුව ඇති බවත්;

(v) එම රෝහල අවට ප්‍රදේශවල දුෂ්කර ගම්මාන සහ වතු ජනතාව විශාල වශයෙන් ජීවත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම අසීරුතාවයන් මඟහරවා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2293/2026

ගරු සුරංග රත්නායක මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නෑගම්පහ ප්‍රාදේශීය රෝහල C ශ්‍රේණියට අයත් ප්‍රාදේශීය රෝහලක් බවත්;

(ii) එම රෝහලේ අනුමත කාර්ය මණ්ඩලය අනුව වෛද්‍ය නිලධාරීන් තිදෙනෙකු සේවයේ නියුක්ත විය යුතු බවත්;

(iii) මේ වනවිට එම රෝහලේ එක් වෛද්‍ය නිලධාරියෙකු පමණක් සේවය කිරීම හේතුවෙන් සෞඛ්‍ය සේවා සැපයීමේදී දුෂ්කරතා මතුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම රෝහලේ පවතින වෛද්‍ය නිලධාරි හිඟය පියවා අවශ්‍ය වෛද්‍ය නිලධාරීන් පත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා අපේක්ෂිත කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 සැප්තැම්බර් 25 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

31/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සහල් හිඟයක් මතුවූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) එම අවස්ථාවලදී සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් සහල් ආනයනය කළ අවස්ථා සංඛ්‍යාව සහ එම එක් එක් අවස්ථාවේදී ආනයනය කළ සහල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එලෙස ආනයනය කරන ලද සහල්, සතොස ආයතනය මඟින් වෙනත් පුද්ගලයන්ට සහ වෙළෙන්දන්ට නීති විරෝධී ලෙස අලෙවි කර තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

142/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපයන විට ගෙවීමේ බද්ද (PAYE Tax) හඳුන්වා දුන් දිනය කවරේද;

(ii) එම බද්ද ක්‍රියාත්මක වන ක්‍රමවේදය කවරේද;

(iii) වර්ෂ 2022 සිට 2025 දක්වා එම බද්ද මඟින් රජයට ලැබුණු ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම බද්ද හේතුවෙන් මෙරට වෘත්තීයවේදීන් අපහසුතාවයකට පත්ව ඇති බව පිළිගන්නේද;

(v) එම බද්ද සංශෝධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

686/2025

ගරු රෝහණ බංඩාර මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාව ලබා ගන්නා පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වනවිට එම රෝගීන්ට ලැබෙන දීමනාව කොපමණද;

(iii) එම දීමනාව ලබා ගැනීම සඳහා දැනට පොරොත්තු ලේඛනයේ සිටින සංඛ්‍යාව කොපමණද;

(iv) එම පිරිස සඳහා දීමනාව ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1807/2026

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ —

(i) වනාන්තර ලෙස ගැසට් කළ;

(ii) රක්ෂිත බවට පත් කිරීමට යෝජිත;

(iii) රක්ෂිත ලෙස නම් කිරීමට යෝජනා කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අනුමත කරන ලද;

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කිරීමට යෝජිත;

(v) මේ දක්වා ප්‍රදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලද;

ඉඩම් ප්‍රමාණය, ඒවා අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරි කොට්ඨාස සහ ගම්මාන කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරානෛක්කල් ගොවි සංවිධානයට අයත් අක්කර 560ක පමණ ඉඩම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් OMG/PR/02-POLYGON අංකය යටතේ රක්ෂිතයක් ලෙස නම් කිරීමට යෝජනා කර තිබේද;

(ii) එම ඉඩම 1979 වර්ෂයේ සිට වගා කටයුතු සඳහා භාවිතා කර, 1983 වර්ෂයේ සිට වාර්ෂික ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iii) එසේ නම්, අංක 2008/04 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව එම ඉඩම නැවත ගොවීන්ට ලබාදීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2107/2026

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උඩවලව ජාතික වනෝද්‍යානය සහ ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය අතර පිහිටි අලි කොරිඩෝව ගැසට් කරන ලද දිනය කවරේද;

(ii) කොරිඩෝව දෙපස ආරක්ෂිත විදුලි වැට ස්ථාපනය කරන ලද දිනය කවරේද;

(iii) මෙම විදුලි වැට ඉදිකිරීමේ මූලික අරමුණ කවරේද;

(iv) අලි වැට ඉදිකිරීම සඳහා දරා ඇති මුළු පිරිවැය කොපමණද;

(v) 2018 වර්ෂයේදී අලිවැට තිබියදීත් උදෑසන කාලයේ ගම්වැදුණු අලියෙකු විසින් පාසල් දරුවෙකු මරණයට පත් කළ බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලි කොරිඩෝව දෙපස ස්ථාපනය කර ඇති විදුලි වැටෙහි බලහරුව ගම්මානය ආවරණය වන කොටසෙහි ප්‍රධාන විදුලි වැට මේ වනවිට අක්‍රියව පවතින බව දන්නේද;

(ii) එම විදුලි වැට ඉවත් කිරීම සඳහා තීරණයක් ගෙන තිබේද;

(iii) එසේ නම්, එම තීරණය ගත් දිනය සහ අරමුණ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2135/2026

ගරු ඔෂානි උමංගා මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බණ්ඩාරගම, මිල්ලනිය සහ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වලින් මේ වනවිට ප්‍රදානය කර ඇති ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්ලාභීන්ගේ නාම ලේඛනයක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනවසරයෙන් අත්පත් කරගෙන හෝ භාවිතා කරනු ලබන කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ —

(i) බදු පදනම මත ලබාදී ඇති කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් වාර්ෂිකව අය කරනු ලබන බදු මුදල;

(ii) බදු ගිවිසුම් පවතින නමුත් බදු මුදල් අයකර නොගන්නා ඉඩම් ප්‍රමාණය;

(iii) බදු ලබාදීම සඳහා පවතින නිරවුල් ඉඩම් ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2137/2026

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, 2000 වර්ෂයේ සිට මේ දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ලබාදුන් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(ii) ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉඩම් ප්‍රදානය කිරීමේදී අනුගමනය කර ඇති කොන්දේසි කවරේද;

(iv) එම කොන්දේසි උල්ලංඝනය කළ ඉඩම්ලාභීන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2270/2026

ගරු රුවන් මාපලගම මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර ඇති රජයේ නිවාස ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් නිවාස ව්‍යාපෘතියේ ආරම්භ කළ වර්ෂය, ජනතා අයිතියට පත් කළ වර්ෂය, භූමි ප්‍රමාණය සහ මේ වනවිට පවතින නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිට්ටඹුව, රන් පොකුණුගම නිවාස සංකීර්ණය තුළ ක්‍රියාත්මක කර ඇති 'රනිඳුගම' සහ 'ගුරු ගම්මානය' නිවාස ව්‍යාපෘති සඳහා නිවාසලාභීන් තෝරාගැනීමේදී භාවිතා කළ නිර්ණායක කවරේද;

(ii) එම නිවාස ව්‍යාපෘති දෙකෙහි පිහිටි නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම ව්‍යාපෘති යටතේ එක් නිවාස ඒකකයක් සඳහා රජය විසින් ලබාදී ඇති ආධාර/ණය මුදල කොපමණද;

(iv) එම නිවාසලාභීන්ට ඔවුන් පදිංචිව සිටින ඉඩම්වල අයිතිය පැවරීම සඳහා ගෙවිය යුතු මුදල තීරණය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2277/2026

ගරු චමින්ද ලලිත් කුමාර මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවීමේ අරමුණු කවරේද;

(ii) එම මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන දායක විශ්‍රාම වැටුප් ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iii) එම විශ්‍රාම වැටුප් ක්‍රම කවරේද;

(iv) එම එක් එක් විශ්‍රාම වැටුප් ක්‍රම සඳහා මේ දක්වා දායකවී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) එලෙස දායකවී ඇති පුද්ගලයන් අතරින් මේ වනවිට විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල —

(i) ප්‍රමාණවත් ගිනි නිවීම් සේවා පහසුකම් නොමැති බව දන්නේද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක ගිනි නිවීම් මධ්‍යස්ථාන සහ ගිනි නිවන රථවාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ගිනි ගැනීම්වලදී ක්ෂණික සහාය සැපයීම සඳහා ගත වන සාමාන්‍ය කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම දිස්ත්‍රික්කවල —

(i) ගිනි නිවීම් සේවා සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පසුගිය වර්ෂ 03 තුළ ගිනි නිවීම් සේවා සංවර්ධනය සඳහා වෙන් කරන ලද සහ වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගිනි නිවන භටයින්ට නවීන ආරක්ෂණ උපකරණ සහ විශේෂ මුදාගැනීමේ පුහුණුව ලබාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම දිස්ත්‍රික්කවල —

(i) සියලු පහසුකම්වලින් සමන්විත නවීන ගිනි නිවීම් මධ්‍යස්ථාන පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) නව ගිනි නිවන වාහන සහ ජල බවුසර් ලබා දීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) ගිනි නිවීම් සේවා සංවර්ධනය සඳහා කඩිනම් සැලසුම් නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?